# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 82 — 1973 ඔක්තෝබර් 19 වැනි සිකුරාද — 1973.10.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම හොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

සැළකිය යුතුයි.—ධීවර (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ඔක්තෝබර් 12 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... ... ... | 1425 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1426 |

## තනතුරු — ඇබෑර්තු

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළවන පොදු කොන්දේසි

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත් වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන්ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 :1 ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද් යටත් විය යුත්තාහ :—

4 :1 :1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 :1 :2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්වන්නාවූත්, අනාගතයේ දී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 :3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීනතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වූවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත් හිටුවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී නව මාස හයක කල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වූවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක විය යුත්තේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක, දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 ; 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/ තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ සෙච්ඡා දායක මුදලක් එම කරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම් නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 5 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතියේ නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේව යෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුව හොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ උඩපළාත නැගෙනහිර "ඒ" සහ "බී" කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූර**

මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ උඩපළාත නැගෙනහිර "ඒ" සහ "බී" යන කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධූර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973. 11. 14 වෙනි දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය :—

"දිසාපති, කච්චේරිය, මහනුවර"

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 බැගින් ගාස්තුවක් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හෝ 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු තමා ඉල්ලුම් කරන කොට්ඨාශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 දක්වා වූ කාලයෙහි සිංහල පාඨමාලා හැර යාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැර යාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත්වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබා ගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද පළාත් පාලන ආයතන වල නියෝජිතයන්ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට සුදුස්සෝ නොවෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුන බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනයක කැපෑලෙන් එවිය යුතුවේ.

7. උඩපළාත නැගෙනහිර "ඒ" කොට්ඨාශය දෙහිදෙනිය, පොහො ලියද්ද, මිනිගමුව, වැත්තෑව, කුරගම යන ග්‍රාමසේවක කොට්ඨාශ වලින්ද උඩපළාත නැගෙනහිර "බී" කොට්ඨාශය ගලගෙදර, ගලගෙදර මඩිගේ හද්දාපිටිය, කොබ්බෑගල යන ග්‍රාමසේවක කොට්ඨාශ වලින් ද සමන්විතය.

ඇල්. ඒ උඩුවෙල,
මහනුවර අතිරේක දිසාපති.

1973 ඔක්තෝබර් 02 දින,
මහනුවර දිසාපති කාර්‍යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ උඩපළාත නැගෙනහිර*............කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.
   (ආ) උපන් දින සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර : ————.
9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණය ගැතිවී සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.
13. ග්‍රාමසේවක කොට්ඨාශය :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

*අයදුම්කරන කොට්ඨාශය "ඒ" හෝ "බී" යනු සඳහන් කරන්න.

10–533—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

**මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ බටහිර, මොරවක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ බටහිර, මොරවක හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා වරල්ල, මොරවක, වැලිට, රඹුකන, අලපලාදෙනිය, බෑනගල හා කලුමෝඩිපියන යන ග්‍රාම සේවක කොට්ඨාශවල ස්ථිර පදිංචිය ඇත්තාවූ පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. මේ සඳහා මෙම කාර්යාලයෙන් හෝ කොටපොල, ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාලයෙන් හෝ නිකුත් කරනු ලබන අයදුම්පත්වල ඉල්ලා ඇති විස්තර නියි අයුරු සම්පූර්ණ කර අදාල සහතිකවල පිටපතක්ද සමග 1973 නොවැම්බර් මස 20 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

1. **ලිපිනය :** දිසාපති, දිසාපති කාර්යාලය, මාතර.

2. **සුදුසුකම් :—**

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී කොට්ඨාශයන්හි ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඈ) 1925 හා 1944 අතරතුර කාලයෙයි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්—

**නැතහොත්**

සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් වීම.

(ඉ) රජයේ, සංස්ථා, පලාත් පාලන ආයතනයක සේවකයින් නොවිය යුතුය.

(ඊ) පලාත් පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල **පිටපත්** අමුනා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (මින් එකක් පලාතේ ග්‍රාම සේවක ගෙන් විය යුතුය.)

(ඈ) කොට්ඨාශයේ ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම සේවකයේ සහතිකය (මෙය කොටපොල ප්‍රාදේශීය ආදායම් නිලධාරි මගින් ග්‍රාම සේවකට එවිය හැකිය.)

4. මිට අමතරව තම අයදුම්පත සමග එම අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය බවටත්, තමා ණයගැති නොවන බවටත් දිවුරුම් සහතිකයක් අමුනා එවිය යුතුය.

5. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

6. අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිමට සිදුවිය හැක. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

ඩබ්. ඒ. ඇල්. විජයපාල,
මාතර දිසාපති.

1973 ඔක්තෝබර් 03 දින,
මාතර දිසාපති කාර්යාලයේ දීය.

10–537—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු කලාගම් කෝරලේ කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කලාගම් පළාත කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධූරය**

දකුණු කලාගම් කෝරලේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචිවී සැහෙන දේපලක්ද, ගම්වාසීන්ගේ සැලකිල්ලද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩුවිය යුතුයි. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්සභා උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1973 නොවැම්බර් මස 20 වෙනි දින හෝ එදිනට පෙර හෝ මාවෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

එල්. බී. ඩී. ජයසේන,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1973 ඔක්තෝබර් මස 3 වෙනි දින,
අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

10–549—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව**

ආධුනික සැලසුම්කරු (තාවකාලික) තනතුරු

ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කර 1973. 11. 20 වැනි දිනට හෝ ඊට පෙර රත්මලාන, ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂගේ ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය :** මෙම තනතුරට අදාළ ඒකාබද්ධ වැටුප් ක්‍රමය : රු. 3,000—3×90—රු. 3,270 (වාර්ෂික) වේ. 1969. 10. 1 දිනට පෙර වැටුප් ක්‍රම : රු. 960—2×72—රු. 1,104 (වාර්ෂික).

සටහන : පහත 5 (ii) (අ) සහ 5 (ii) (ආ) ඡේදයන්හි සඳහන් සුදුසුකම් ලබා ඇති අය පටන් ගැනීමේදී පිළිවෙළින් රු. 3,090 සහ රු. 3,180 වැටුප් පියවරවල් මත තැබීමට සුදුස්සෝ වෙත්.

3. **බඳවා ගැනීමේ ක්‍රමය :** තෝරා ගැනීමේ කාර්යය සඳහා සැදුම් ලත් තේරීම් මණ්ඩලයක් මගින් සුදුසුකම් ලත් අයදුම්කරුන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

4. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—**

(අ) මෙම තනතුර තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) තෝරාගනු ලැබූ පහත 5 ඡේදයේ (ii) (අ) යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයින්, දෙපාර්තමේන්තුවේ දෙවර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතු අතර, 5 ඡේදයේ (ii) (ආ) යටතේ සුදුසුකම් ලබන්නන් එක් වර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුය.

(ඇ) ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් සහ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් වීමෙන් පසුව, අපේක්ෂකයින් II පෙළ සැලසුම්කරුවන් වශයෙන් ස්ථිර/තාවකාලික තනතුරුවලට පත් කරනු ලැබේ.

(ඈ) තෝරාගනු ලබන අයදුම්කරුවන්ට කාර්යාල ඇතුළත මෙන්ම එළිමහනේද රාජකාරි කිරීමට නියම කරනු ඇත.

(ඉ) පත්කරනු ලබන අපේක්ෂකයින් සිය පාඩම් මාලාව (එනම් දෙවන ශ්‍රේණියේ සැලසුම්කරුවන් සඳහා සේවයට බඳවා ගැනීමේ පාටිපාටියේ 3(1) ඡේදයේ නියමිත දෙපාර්තමේන්තු විභාගවලින්) අවංකව හා අනලස්ව හදාරා දෙවැනි පෙළේ සැලසුම්කරුවන් වශයෙන් සුදුසුකම් ලබා ගැනීමට ත් පුහුණුව අවසන් කිරීමෙන් පසුව, නියම කරනු ලැබුව හොත් පස් වර්ෂයකට නොඅඩු කාල සීමාවක් II පෙළ සැලසුම්කරුවකු වශයෙන් ගිවිසුම් පත්‍රයකට ඇතුළත් විය යුතුය. මෙම කොන්දේසි හරියාකාරව පිළිපැදීම සඳහා පුහුණුව ලබන්නක් සහ ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් ඇපකරුවන් දෙදෙනෙකුද ඇතුළුව රු. 5,000 ක බැඳුම්කරයක ඇතුළත් විය යුතුය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) සෑම අයදුම්කරුකුම 1973. 11. 20 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය.

(ii) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂය යන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළෙන් සාමර්ථය සහ පහත දැක්වෙන සුදුසුකම් වලින් එකක් තිබිය යුතුය:—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පූර්ණ කාල දිවා පාඨ මාලාවක් (සැලසුම්කරු පාඨමාලාව), සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ,

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ, කණිෂ්ඨ කාර්මික නිලධාරි පාඨ මාලාව (දෑවුරුදු) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ

(ඇ) ගොඩනැගිලි නිර්මාණය කිරීම සඳහා වූ සන්ධ්‍යා හෝ අර්ධ කාලීන පාඨමාලාවේ I, II සහ III වෙනි කොටස් සාර්ථක ලෙස අවසන් කිරීම.

6. අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල පිටපත් තම අයදුම් පත්වලට යා කර එවිය යුතුයි:—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) **සුදුසුකම්.**—චරිත සහ පත්වීම් සඳහා තිබෙන යෝග්‍යතාවය පිළිබඳ මෑතදී ලබාගත් සහතික තුනක්, ඉන් එකක් අපේක්ෂකයා අන්තිමවරට ඉගෙනීම ලද පාසැලේ මුල් ගුරුවරයාගෙන් විය යුතුය.

(ඇ) ලබාඇති වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික සහ සිංහල/දෙමළ විභාග වලින් ලබා ඇති සාමාර්ථය දැක්වෙන සහතිකය.

7. දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් තම අයදුම් පත් 109 වැනි පාලන රෙගුලාසිවලට අනුව තම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/ආයතනයේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන විට අයදුම්කරු එම තනතුරට තෝරාගනු ලැබුවහොත්, රාජකාරි භාර ගැනීම සඳහා මුදවා හැරිය හැකිද, නොහැකිද, යන වග දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය. නියමිත දිනයෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන මෙවැනි අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නියමිත දිනට පෙර ලැබී, ප්‍රමාදය ගැන පිළිගත හැකි හේතු දක්වමින් දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/ආයතනයේ ප්‍රධානියා විසින් පිළිගත යුතු බවට නිර්දේශ කර තිබුනොත් මිසක පිළිගනු නොලැබේ.

8. ඉල්ලුම්පත් සහ ඒ පිළිබඳ වෙනත් ලියුම් සියල්ලක්ම "රත්මලානේ, ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ" නැතට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකර ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි වෙතද අවධානය යොමු කෙරේ.

ජේ. ඩී. ඊ. පෙරේරා,
වැඩබලන අධ්‍යක්ෂ,
ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව.

1973. 10. 09 වැනි දින,
රත්මලානේ,
ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ දී.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව-ආධුනික සැලසුම්කරු තනතුරු

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්):————.
   (අ) වාසගම:————.
   (ආ) වෙනත් නම්:————.

2. තැපැල් ලිපිනය:————.

3. උපන් දිනය:————.
   අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (1973. 11. 20) වයස අවු.:———, මාස:———.

4. පුරවැසි භාවය හා එය ලබාගත් අන්දම:—
   (අ) පරම්පරාවෙන්:————.
   (ආ) ලියාපදිංචි වීමෙන් (ලියාපදිංචි වීමෙන් පුරවැසි භාවය ලබා ඇත්නම්, එම සහතිකයේ අංකය හා දිනය සඳහන් කළ යුතුය):————.

5. උපන් ස්ථානය:—
   (අ) අයදුම්කරුගේ:————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ:————.
   (ඇ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තාගේ:————.
   (ඈ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තාගේ:————.

6. විවාහකද අවිවාහකද යන වග:————.

7. අධ්‍යාපනය ලබා ඇති පාසැල් හෝ විද්‍යාලයන්හි නම් (ඇතුළත් වූ දිනයන් හා අස්වූ දිනයන් සඳහන් කළ යුතුය):————.

8. අධ්‍යාපනික සුදුසුකම් (එම සුදුසුකම් ලබාගත් දිනයන් සඳහන් කළ යුතුය):—
   (අ) සාමාන්‍ය අධ්‍යාපනය:————.
   (ආ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම්:————.

9. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ පසු කරන ලද රැකියාවන් (බැඳුන හා අස්වූ දිනයන් සඳහන් කළ යුතුය):————.

10. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර:————.

11. සිංහල හා දෙමළ පිළිබඳ ලබාගෙන ඇති උසස්ම සුදුසුකම්:————.

12. දැන්වීමේ 5 (ii) ඡේදයේ කුමන උප ඡේදයක් යටතේ ඔබ සුදුසුකම් ලබා ඇද්ද?:————.

13. වෙනත් කරුණු:————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කර තිබෙන සියළුම විස්තර සත්‍යවූද, නිවැරදිවූද කරුණු බව මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත් තෝරා බඳවා ගැනීමට පෙර වරද අනාවරණය වී නම්, නුසුදුස්සකු වීමටද, බඳවා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම්, කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකරන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය:————.

10-686—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා තෙල් සහ මේධ සංයුක්ත මණ්ඩලය**
**විධායක පුරප්පාඩු**

ලාංකිකයින්ගෙන් පහත සඳහන් තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

**(1) සාමාන්‍යාධිකාරි:**

**වැටුප් ප්‍රතිමාණය.**—රු. 1,800—50—රු. 2,000 (සියලු දීමනා අඩංගු මාසික).

**වයස් සීමාව.**—අවුරුදු 50 න් පහළ.

**අධ්‍යාපන සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමග යාන්ත්‍රික ඉංජිනේරු, සේවක මණ්ඩල සහ සාමාන්‍ය පරිපාලන සහ නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි ජ්‍යෙෂ්ඨ විධායක තත්ත්වයේ අවුරුදු 15 ක පළපුරුද්ද, හෝ

අවුරුදු 10 ක පශ්චාත් වෘත්තීය පළපුරුද්ද සහිත වෘත්තීය සුදුසුකම් ඇති පුද්ගලයෙක් විය යුතුය.

**(2) යාන්ත්‍රික ඉංජිනේරු තනතුර:**

**වැටුප් පරිමාණය.**—රු. 1,000—45—රු. 1,225 (සියලු දීමනා අඩංගු අඩංගු මාසික).

**වයස් සීමාව.**— අවුරුදු 45 න් පහළ.

**අධ්‍යාපන සුදුසුකම්.**—යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක බී. එස්. සී. උපාධිය හෝ සමාන සුදුසුකම් සමග පිළිගත් රජයේ හෝ කර්මාන්ත ආයතනයක අවු වශයෙන් අවුරුදු 5 ක ප්‍රායෝගික පළපුරුද්ද.

**සාමාන්‍ය කොන්දේසි**

1. අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතුය.

2. තෝරා ගන්නා අපේක්ෂකයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව අදාළ වැටුප් ක්‍රමයේ සුදුසු සංඛ්‍යාවක පත් කිරීම ගැන සලකා බලනු ඇත.

3. අර්ථ සාධක අරමුදලේ දායක ගෙවීම් අර්ථ සාධක අරමුදල් ආඥපනත ප්‍රකාරව වනු ඇත.

4. රජයේ සේවාවේ හෝ අනිකුත් සංයුක්ත මංඩලවල නිලධාරීන්ගේ අයදුම්පත් සලකා බලනු ඇත්තේ ඒවා ඔවුනොවුන්ගේ ආයතනවල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවුවහොත් පමණකි. කෙසේ වුවද අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනට ප්‍රථමයෙන් ඔවුන් විසින් අයදුමේ පිටපතක් සංයුක්ත මණ්ඩලය වෙත එවිය යුතු වන්නේය. මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව මාරු කරනු ලබන්නාවූ ස්ථිර සහ විශ්‍රාම ලාභ අයිති රජයේ සේවා නිලධාරීන් සම්බන්ධයෙන් කල්තැබූ විශ්‍රාම ලාභ එල සම්බන්ධයෙන් අවකාශ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික ආඥපනත යටතේ හිමි වන්නේය.

5. රජයේ භාෂා ප්‍රතිපත්තියට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා ආඥාපනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති හෝ මෙයට පසුව පනවනු ලබන්නාවූ ඕනෑම නීතියකට අනුකූලත්වය දැක්වීම තෝරාගත් අපේක්ෂකයා වෙතින් අවශ්‍ය කරවනු ඇත.

6. ප්‍රධාන රාජකාරි ස්ථානය සීදූව වේ.

7. තෝරාගනු ලබන අයදුම්කරු සංයුක්ත මංඩල නිවාසයක හෝ සීදූවට කිට්ටු ස්ථානයක පදිංචි විය යුතුය.

8. තෝරාගනු ලබන අයදුම් කරු ඇප තැබිය යුතුවේ.

9. පහත දක්වා ඇති අයදුම් පත් ආකෘතිය අනුව අයදුම් පත් සැකසිය යුතුයි. එම ආකෘතිය අනුව සකසා නොමැති අයදුම් පත් බාර නොගන්නා බැව් සැලකිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවර යෙහි වම් කෙළවරෙහි උඩ අයදුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය. අයදුම් පතට අනුග්‍රහ පිණිස වන සහතිකපත් සහ චරිත සහතික පත්වල පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

10. සියලුම අයදුම්පත් 1973.11.2 දින දහවල් 12 ට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය, සීදූව යන ලිපිනයට එවිය යුතුයි.

ලංකා තෙල් සහ මේද සංයුක්ත මංඩලය, සභාපති.
සීදූව, 1973.10.03 වැනිදා.

### ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය

.............................. තනතුර සඳහා අයදුම් පත

අයදුම් පත් භාර ගැනීමේ අවසැන දිනය :————.

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනිකුත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් ස්ථානය හා දිනය :————.
   (ආ) අයදුම් පත් භාරගැනීමේ අවසාන දිනය වනවිට වයස :————.

4. ජාතිය :————.

5. (අ) අයදුම්කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) ඔහුගේ උපන් දිනය හා ස්ථානය :————.
   (ඇ) ඔහුගේ ජාතිය :————.

6. විවාහ තත්ත්වය :————.
   (විවාහක, අවිවාහක හෝ වැන්දඹුද යන්න කරුණාකර සඳහන් කරන්න. විවාහක නම් විවාහ වූ දිනය සහ ළමයින් ගේ ප්‍රමාණයද සඳහන් කරන්න)

7. අධ්‍යාපනය ලද්දාවූ පාඨශාලා සහ විද්‍යාලයන්, ඇතුලත්වීමේ සහ අස්වීමේ දිනයන් සහිතව මෙහි පහත සඳහන් අධ්‍යාපන ශ්‍රේණීන් වෙනුවෙන් :
   (අ) සාමාන්‍ය අධ්‍යාපනය :————.
   (ආ) වෘත්තීය අධ්‍යාපනය :————.

8. වෘත්තීය සහ අධ්‍යාපනික සුදුසුකම්, ඒවා ලබාගත් දිනයන් සහ සමර්ථවූ විෂයයන්ද සහිතව :————.

9. පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසුව ලැබූ රක්‍ෂා, පත්වීමේ සහ අස්වීමේ දිනයන් සහ ලද්දාවූ වැටුප්වල විස්තරද සහිතව :————.

10. භාෂා ප්‍රවීනත්වය :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) අනිකුත් භාෂා :————.
   (සිංහල සහ දෙමළ සම්බන්ධයෙන් සමර්ථවී ඇති ඉහළම විභාගය සඳහන් කරන්න).

11. ක්‍රීඩා ප්‍රවීණත්වය සහ නානාවිධ සංස්කෘතික සහ සමාජමය ක්‍රියාකාරිත්වයන්හි දක්වන උනන්දුව විශේෂයෙන් කාර්මික සමාජයකට වැඩදායි ඒවා කෙරෙහි :————.

12. පෞද්ගලික ජීවිතයේදී ඔබ මැනවින් දන්නා හඳුනන අය තිදෙනෙකුගේ නම් සහ ලිපිනය හා පදවි නාමයන් :—
   (1) ————.
   (2) ————.
   (3) ————.

13. සහතික ලබාගෙන ඇත්තාවූ අයගේ නම සහ පදවි නාමයන් :————.
   (1) ————.
   (2) ————.
   (3) ————.

14. වෙනත් තොරතුරු :————.
   ඔබ පත්වීම් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබට රාජකාරි භාර ගතහැකි ඉතාමත්ම කඩිනම් දිනය කුමක්දැයි යන්න කරුණාකර සඳහන් කරන්න :————.

මවිසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇත්තාවූ විස්තර තොරතුරු සත්‍ය සහ නිවැරදි ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරු අසත්‍ය යයි හෝ සාවද්‍ය යයි යන්න සොයා ගනු ලැබුවහොත් තේරීමේදී හෝ තේරීමට ප්‍රථම මා නුසුදුස්සෙකු වීමට එය හේතුවනු ඇති බවත් යම් හෙයකින් සාවද්‍යතාවය සොයාගනු ලැබුයේ පත්වීමට පසුව නම් කිසිම වන්දියකින් තොරව මා රක්‍ෂාවෙන් නෙරපා දැමිය හැකි බවත් මම දන්නෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-651—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

#### ඇබෑර්තු

මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත් 1973 ඔක්තෝබර් මස 31 වෙනි දින හෝ ඊට පෙර,

   සේවක මණ්ඩල නිළධාරි (රැකියා),
   ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
   අංක 113, ගාලුපාර,
   කොළඹ 3

යන ලිපිනයට ලියා පදිංචි තැපැල් මගින් එවිය යුතුය.

3. මෙහි දක්වා ඇති වැටුප් ක්‍රම ඒකාබද්ධ වැටුප් ක්‍රම වේ.

4. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.08.20 වෙනි දින දරණ චක්‍රලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිළධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකි දැයි යන්න දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

5. ඉල්ලුම්පත් ලැබුණු බව නොදන්වන අතර, මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවනට අනුකූලව පිළියෙළ නොවුණු ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

6. (i) **සේවා කොන්දේසි.**—තෝරා ගනු ලබන අපේක්ෂකයින්—

(අ) සිය ශාරීරික යෝග්‍යතාවය දක්වීම සඳහා පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් සිය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

(ඇ) සිය වැටුපෙන් 6%ක් සේවක අර්ථසාධක අරමුදල් සඳහා දයක විය යුතුයි. (ඒ සඳහා සංස්ථාව විසින් 9%ක ප්‍රමාණයක් දයක වනු ඇත.)

(ඈ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ යුතුව ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

| තනතුර හා වැටුප් පරිමාණය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| 1. අර්ථ ශාස්ත්‍රඥ<br>ඒ—2/3 ශ්‍රෙණිය<br>රු. 1,550—රු. 2,100<br>———<br>11 × 50 | (අ) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා යහපත් ශරීර සෞඛ්‍යයකින් හෙබි අය විය යුතුයි.<br>(ආ) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි.<br>(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක, අර්ථ ශාස්ත්‍රය පිළිබඳ පළමුවන පෙළ හෝ දෙවන පෙළ ගෞරව උපාධිධරයෙක් විය යුතුයි.<br>(ඈ) උපාධිය ලබා ගැනීමෙන් පසු විවිත්‍ර ක්‍රම සම්පාදනය හා ඖෂධිත්‍ය අධ්‍යාපනය ආදිය සම්බන්ධයෙන් අවුරුදු 8 ක පළපුරුද්දක් තිබිය යුතුයි.<br>තවද,<br>(i) සංඛ්‍යා ලේඛන විශේෂ විෂයයක් වශයෙන් හදරා ඇති<br>(ii) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති අයට විශේෂයෙන් සලකනු ලැබේ. |

ඒ-2/3 ශ්‍රේණියේ තනතුර සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින් නොමැති වුවහොත්, අන් සියලුම සුදුසුකම් සමඟ අවුරුදු 4 ක පළපුරුද්දක් ඇති අය ගැන ඒ-4 ශ්‍රේණියේ තනතුරක් සඳහා සලකා බලනු ලැබේ. එම තනතුරට අදාල වැටුප් පරිමාණය :

රු. 1,300—1,850 වේ.

11 × 50

තෝරා ගනු ලබන අපේක්ෂකයා, ඔහු ලබා ඇති සුදුසුකම් හා පළපුරුද්ද අනුව අදාල වැටුප් පරිමාණයේ වැටුප් ලක්ෂ්‍යයක් මත තබනු ඇත.

2. ප්‍රාදේශීය පරිපාලක (සේවා) බී-1 ශ්‍රේණිය රු. 580—795

7 × 20 : 3 × 25

(අ) අයදුම්කරුවන්ට කණිෂ්ඨ කාර්මික නිළධාරි සහතිකය (කාර්මික හෝ සිවිල්) හෝ ඒ හා සමාන වෙනත් සහතිකයක් සමග කාර්මික වැඩ පළක යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පරිපාලන තත්ත්වයේ පළපුරුද්දක් තිබිය යුතුය.

(ආ) සිවිල් ඉංජිනේරු පළපුරුද්ද අමතර සුදුසු කමක් වනු ඇත.

(ඇ) එන්ජින්, පොම්ප ආදිය අලුත් වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පළපුරුදුකම් ලබා ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන),
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

113, ගාලු පාර,
කොළඹ 3.

10-649—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධිකාරි ඉංජිනේරු තනතුරක් සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

සුදුසුකම්.—(අ) එම්.අයි.ඊ.ඊ. හෝ ජී.එම්.අයි.ඊ.ආර්.ඊ. සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ;
සහ

(ආ) විධායක තත්ත්වයේ අඩු වශයෙන් අවුරුදු 5 ක් සහිතව ඉලෙක්ට්‍රොනික් විද්‍යාව/විදුලි සංදේශ විද්‍යාව පිළිබඳ යටත් පිරිසෙයින් 10 වසක පළපුරුද්ද ;
හෝ

ගුවන් විදුලි ආයතනයක ඉංජිනේරුවරයකු වශයෙන් අවුරුදු 5 ක සේවය.

වයස.—අවුරුදු 35 කට නොඅඩු විය යුතුයි.

වැටුප් ක්‍රමය.—රු. 1,250—1,750 (50 × 10) කි. රු. 1,350 පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.

මෙම දන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම් පත් 1973 නොවැම්බර් 10 වැනි දිනට පෙර කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර 'අධිකාරි ඉංජිනේරු තනතුර සඳහා වූ අයදුම් පත' යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

රිජ්වේ තිලකරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

1973 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම් පත

### ලංකා ගුවන් විදුලි සංස්ථාව

............................තනතුර සඳහා අයදුම් පතයි

1. සම්පූර්ණ නම :————.
(අ) මුල් අකුර සහිත නම :————.
(මහත්මයා ද, මහත්මිය ද, මෙනවිය ද, යන වග සඳහන් කරන්න)

2. පුද්ගලික ලිපිනය :————.

3. උපන් දිනය :—
1973.11.10 දිනට වයස :
අවු :————. මාස :————. දින :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

4. ජාතිය :————.

5. අධ්‍යාපන පුහුණුවීම :————.

| අධ්‍යාපනය ලැබූ පාසැල් හා ආයතනය | දින සිට | දක්වා | සමත් වී ඇති විභාගය | දරු වගකිව යුතු තත්ත්ව හා යෙදූ පරිබාහිර කටයුතු |
|---|---|---|---|---|
| | | | | |

6. සමත් වී ඇති උසස්ම විභාගය :
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

7. කාර්මික/වෘත්තීය සුදුසුකම් :————.

8. පළපුරුද්ද :————.
(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාලක්‍රමානුගතව යොදන්න).

9. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපිනය හා තත්ත්ව :—
1 :————.
2 :————.
3 :————.

10. චරිත සහතික ලබා ගෙන ඇති අයගේ නම් හා තනතුරු :—
1 :————.
2 :————.
3 :————.

11. වෙනත් විස්තර :————.

මා ඉහත ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි හා සත්‍ය තොරතුරු බවත්, මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත් වුවහොත් මා විසින් ඉහත දෙන්නට යෙදුණ අසත්‍ය හෝ වැරදි තොරතුරුක් වෙතොත් එම හේතුවෙන් සේවයෙන් පහ කිරීමේ දඬුවම් ලැබීමට මා සුදුස්සෙකු වන බවත් විශේෂයෙන්ම මීට පෙර රැකියාවල් පිළිබඳ හෝ මීට අදළ වැදගත් කිසියම් කරුණක් පිළිබඳව හෝ හිතා මතා වසන් කිරීම නිසා එවැනි දඬුවමක් මට එල්ලවන බවත්, මා වටහා ගත් බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-708—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය

### බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන වැලිපැන්න ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්, ඉදිගස්තුඩුව, වලගෙදර, මීගම, ආඳාවල, ලෙව්වන්දූව, වටහිර වැලිපැන්න, නැගෙනහිර වැලිපැන්න බොස්දූපිටිය යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුලත් වැලිපැන්න ගම් සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම් 1973 නොවැම්බර් 20 වෙනි දිනට හෝ ඊට පෙර "දිසාපති, කච්චේරිය, කළුතර" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂනයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි 8 වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සංස්ථා හා පළාත් පාලන සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත් භාර ගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 01 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදීය.

### ආදර්ශ අයදුම් පත්‍රය

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන වැලිපැන්න ගම්සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය.

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස: ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කෙළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. අයදුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–645/1—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන හොරවල ගම් සහා ප්‍රාදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්, හොරවල, නවුත්තුඩුව, කිරන්තිඩිය, කොටගෙදර, යටදොල, නාරවිල, ඕවිටිගල (කොටසක්), බෝපිටිය (කොටසක්) සහ පාන්තිය (කොටසක්) යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුලත් හොරවල ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් "1973 නොවැම්බර් 20 වෙනි දිනට හෝ ඊට පෙර, දිසාපති කච්චේරිය, කළුතර" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා 60ට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි 8 වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික,

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබා ගත් සහතික දෙකක්.

5. රජයේ සංස්ථා හා පළාත් පාලන සේවකයින්ගෙන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගෙන් ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් භාර ගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 01 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දී ය.

### ආදර්ශ අයදුම් පත්‍රය

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන හොරවල ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග) පැහැදිලි අකුරෙන් :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස: ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කෙළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–645/2—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ දෙමළ මාධ්‍ය දුෂ්කර පාසල්වලට සහතික පත්‍ර නොලත් උපගුරුවරුන් බඳවා ගැනීම

මෙහි පහත සඳහන් රජයේ දෙමළ මාධ්‍ය දුෂ්කර පාසල්වල සහතික පත්‍ර නොලත් උපගුරු තනතුරු සඳහා, එම පාසල් පිහිටි ගම්වලම හෝ ඊට ඉතාම ආසන්න ගම්වල ස්ථිර පදිංචිය මෙම නිවේදනයේ 4 (ඈ) ඡෙදයේ සඳහන් අන්දමට ඔප්පු කළ හැකි, පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් ලත් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම අයදුම්කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. ලේඛණයේ සඳහන් දුෂ්කර පාසල් අතුරින් තමාගේ ස්ථිර පදිංචිය ඔප්පු කළහැකි ගමේ පිහිටි දුෂ්කර පාසල හෝ ඉතාම ආසන්න ගමේ පිහිටි දුෂ්කර පාසල සඳහා පමණක් අයදුම්කරුවකුට ඉල්ලුම් කළ හැකි අතර, මෙම නිවේදනය අනුව අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම් පත්‍රයක් පමණකි. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ පරිදි පිළියෙල කරගන්නා ලද අයදුම් පත් පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරී වෙත 1973 නොවැම්බර් 20 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ 'දෙමළ මාධ්‍ය දුෂ්කර පාසල්වල සහතික නොලත් උපගුරු තනතුර' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය :—

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ ලිපිනය |
|---|---|---|
| මාතලේ ... | (1) මා/නිකවටවන මු.වි., කිබිස්ස, (2) මා/කරගහතැන්න වි. (දෙ), ගම්මඩුව, (3) මා/නාලියකනත්ත වි., (මු), අඹන | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මාතලේ |
| බණ්ඩාරවෙල ... | (1) බ/පගරගම්මන මුස්ලිම් වි., මාපාකඩවැව ... ... ... | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල |
| හලාවත ... | (1) හලා/පෙරකුවටාන අල්මින්හාජ් වි., කොත්තන්තිව්, (2) හලා/මුදලිප්පාලි ර.මු.වි., පල්ලිවාසල්තුරේ, (3) හලා/නම්මුවාව ර.වි., හිලෝගම, (4) හලා/පන්නව ර.වි., කොබෙයිගනේ, (5) හලා/මදවක්කුලම් ර.මු.වි., ආඩිගම, (6) හලා/කරුන්ගාල් චෝලෙයි දෙ.වි., මුන්දලම, (7) හලා/මඩිහේවීදියාවෙල ර.මු.වි., නාගොල්ලාගොඩ | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, හලාවත |
| කුරුණෑගල ... | (1) කු/අලියාවැටුන වැව මු.වි., තඹුත්ත, ගල්ගමුව, (2) කු/ජාගම අල්හිදයා මු.වි., ගල්ගමුව, (3) කු/වල්පාලුව මු.වි., ගල්ගමුව, (4) කු/රන්දෙනිගම මු.වි., මහව, (5) කු/මැල්ලපොත මු.වි., මිනුවන්ගැටේ, (6) කු/හේනේගෙදර මු.වි., පනාදරගම, (7) කු/ඉඟුරුවත්ත මු.වි., මහමූකලන්යාය, (8) කු/මායිවෙල මු.වි., මැල්සිරිපුර, (9) කු/නොටින්හිල් දෙ.වි., මුවන්කන්ද, (10) කු/යායවත්ත මු.වි., කිරිදිවැව, (11) කු/මීරිහාන්පිටිය මු.වි., ඊතණවත්ත, (12) කු/පනාපිටිය මු.වි., මැටියගනේ, (13) කු/මඩිගේඅනුක්කගේ මු.වි., බණ්ඩාරකොස්වත්ත | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කුරුණෑගල |
| අනුරාධපුරය ... | (1) අ/උඩුඹුගල මු.වි., නේරියකුලම, (2) අ/කොටියාව මු.වි., පරසන්ගහවැව, (3) අ/මරක්කල ඇටවීරවැව මු.වි., කැබිතිගොල්ලෑව, (4) අ/මරක්කල හල්මිල්ලවැව මු.වි., පූනෑව, (5) අ/තිඹිරියත්තාවෙල මු.වි., හොරොව්පොතාන, (6) අ/නිකවැව මු.වි., හොරොව්පොතාන, (7) අ/පත්තෑව මු.වි., හොරොව්පොතාන, (8) අ/ආනබලොන්දව මු.වි., කපුගොල්ලෑව, (9) අ/ඇල්ලවැව මු.වි., කපුගොල්ලෑව, (10) අ/බණ්ඩාර පොතාන මු.වි., මඩාටුගම | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුරය |
| වව්නියා ... | (1) ව/තල්මඩු පියවර 2 ර.මු.වි., ඉරනෙයිඉලුපෙයිකුලම්, (2) ව/චින්නච්ප්පිකුලම් ර.මු.මි.වි., නෙරියකුලම, (3) ව/නේඩුන්කරෙයිචේනෙයි දෙ.වි., චෙඩ්ඩිකුලම්, (4) ව/කෝදන්ඩර්නොච්කුලම් දෙ.වි., වව්නියාව, (5) ව/පාවක්කුලම පියවර 2, අංක 2, දෙ.වි., වාරිකුට්ටිඌරුව, (6) ව/කෝවිල්තුන්ටුකුලම් දෙ.මි.වි., ඕමන්තෙයි, (7) ව/කිඩායි චූරිකරු චේපන්කුලම් දෙ.මි.වි., වව්නියාව, (8) ව/පුදුවිලාන්කුලම් දෙ.වි., මාන්කුලම්, (9) ව/සින්නඩම්පන් දෙ.මි.වි., මාන්කුලම්, (10) ව/සින්නපූවර්සන්කුලම් දෙ.වි., පූලියන්කුලම්, (11) ව/කුලවිසුඩ්ඩාන් දෙ.වි., නෙඩුන්කේනි, (12) ව/අඹගාම දෙ.වි., මාන්කුලම්, (13) ව/ආනන්දර්පූලියන්කුලම් දෙ.වි., පූලියන්කුලම්, (14) ව/තරප්පු කුත්ති දෙ.වි., මාන්කුලම්, (15) ව/නොච්චිකුලම් දෙ.වි., අංක 2, නෙඩුන්කේනි, (16) ව/පට්කුඩිඉරුප්පු දෙ.වි., නෙඩුන්කේනි, (17) ව/පෙරියමඩු දෙ.වි., නෙඩුන්කේනි, (18) ව/ඌන්ජල්කඩ්ඩි දෙ.වි., නෙඩුන්කේනි, (19) ව/තනිමුරිප්පු දෙ.වි., නෙඩුන් කේනි, (20) ව/පාවක්කුලම් යුනිට් 3, අංක 9, දෙ.වි., පෙරියඋලුක්කුලම, (21) ව/ඔදියමලෙයි දෙ.වි., නෙඩුන්කේනි | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, වව්නියාව |
| මන්නාරම ... | (1) මන්/මුන්ඩුමුරිප්පු ර.දෙ.මි.පා., (2) මන්/සිරාට්ටිකුලම් ර.දෙ.මි.පා., (3) මන්/සින්නවලයාන්කට්ටු ර.දෙ.මි. පාසල, (4) මන්/විලාතිකුලම් ර.දෙ.මි.පා., (5) මන්/පනන්කාමම් පුවරසන්කුලම් ර.දෙ.මි.පා., (6) මන්/පනන්කාමම් මුන්ඩුමුරිප්පු ර.දෙ.මි.පා., (7) මන්/පෙරියමුරිප්පු ර.දෙ.මි.පා., (8) මන්/ආතිමෝට්ටෙ ර.දෙ.මි.පා., (9) මන්/පාලම්පිටි ර.දෙ.මි.පා., (10) මන්/කරඩිකුලි ර.මු.මි.පා., (11) මන්/මරිච්චි කට්ටි ර.මු.මි.පා., (12) මන්/පාලෙයික්කුල් ර.මු.මි.පා., (13) මන්/පොන්තීවුකන්ඩල් ර.දෙ.මි.පා., (14) මන්/වාල්කෙයිපට්ටාන්කණ්ඩල් රෝ.ක.දෙ.මි.පා., (15) මන්/අහතිමුරිප්පු ර.මු.මි.පා., (16) මන්/පණ්ඩාරවෙලි ර.මු.මි.පා., (17) මන්/අච්චාන් කුලම් රෝ.ක.දෙ.මි.පා., (18) මන්/තච්චනාමරදමඩු ර.දෙ.මි.පා., (19) මන්/වච්නි කුලම් සෙන්ටර් ස්ලූස් ර.දෙ.මි.පා., (20) මන්/මරදමඩු ර.දෙ.මි.පා., (21) මන්/පරප්පුකඩන්දන් ර.දෙ.මි.පා. | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මන්නාරම |
| ත්‍රිකුණාමලය ... | (1) ත්‍රි/ඉලන්කෙයිතුරෙයි මුහතුවාරම් ර.දෙ.මි.පා., ඊච්චලම්පත්තු, (2) ත්‍රි/ඉලන්කන්දෙයි ර.දෙ.මි.පා., සාම්පූර්, (3) ත්‍රි/කරුක්කාමුනෙයි ර.දෙ.මි.පා., ඊච්චලම්පත්තු, (4) ත්‍රි/වාලෙයිතෝටම් ර.දෙ.මි.පා., තෝප්පූර්, (5) ත්‍රි/නලූර් දෙ.මි.පා., තෝප්පූර්, (6) ත්‍රි/පූනගර් ර.දෙ.මි.පා., ඊච්චලම්පත්තු, (7) ත්‍රි/මාවඩිචේනයි ර.දෙ.මි.පා., ඊච්චලම් පත්තු, (8) ත්‍රි/මෙන්කාමම් ර.දෙ.මි.පා., කිලිවෙඩ්ඩි, (9) ත්‍රි/මොල්ලිපොතාන කොලනි දෙ.පා., මොල්ලිපොතාන, (10) ත්‍රි/ඊච්චන්තිවු විපුලානන්ද වි., ඊච්චන්තිවු, (11) ත්‍රි/තඹලගමුව බටහිර කොලනි දෙ.පා., තඹලගමුව, (12) ත්‍රි/නල්ලකුට්ටිආරු ර.මු.මි.පා., ජන්කුලම්, (13) ත්‍රි/කන්ගුවෙලි ර.දෙ.මි.පා., දෙහිවත්ත, (14) වෙරුගල්මුහත්තුවාරම් ර.දෙ.මි.පා., ඊච්චලම්පත්තු, (15) ත්‍රි/අල්ලෙයි ව.ඉ. 3, ර.දෙ.මි.පා., කිලිවෙඩ්ඩි, (16) ත්‍රි/කාකමුනේ අරාවු මු.වි., කිනියා, (17) ත්‍රි/කාකමුනේ මු.වි., කිනියා, (18) ත්‍රි/තාමරවිල් රෝ.ක.දෙ.මි.පා., කිනියා, (19) ත්‍රි/පුවර්සාන්තිවු මු.වි., කින්නියා, (20) ත්‍රි/සාමවච්චතිවු ර.මු.මි.පා., කිනියා, (21) ත්‍රි/පුත්තුකුඩිඉරිප්පු අලිගාර් වි., කිනියා, (22) ත්‍රි/කච්චකොඩිතිවු ර.මු.මි.පා., කිනියා, (23) ත්‍රි/සූරන්ගල් ර.මු.මි.පා., කිනියා | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, ත්‍රිකුණාමලය |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | පාසලේ නම | පාසල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ ලිපිනය |
|---|---|---|
| පොලොන්නරුව ... | (1) පො/පල්ලියගොඩැල්ල මු.වි., පුලස්තිගම, (2) පො/කටුවන්විල මු.වි., මුතුගල, (3) පො/අලිංචිපොතාන මු.වි., මනම්පිටිය, (4) පො/සොරිවිල දෙ.වි., මනම්පිටිය, (5) පො/කන්දකාඩුව දෙ.වි., වැලිකන්ද, (6) පො/ත්‍රිකෝණමඩු මු.වි., වැලිකන්ද, (7) පො/නුගගහදමන මු.වි., ගිරිතලේ | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, පොලොන්නරුව |

2. **සේවයේ යෙදීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—(අ) (i) මෙම තනතුරු ස්ථිරය. අර්ථ සාධක අරමුදල් පදනමක් මත වනු ඇත. පත් කරනු ලබන අපේක්ෂකයින් ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවිය යුතු අතර, ඒ සඳහා රජයේ දයක මුදල ඒකාබද්ධ වැටුපෙන් 9% ක් වනු ඇත.

(ii) සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) පත්වීමක් ලබන්නා ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ 10:6 සිට 10:14 දක්වා සහ 10:16 උප වගන්තිවල සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුය.

(iv) තෝරා ගනු ලැබූ අයදුම්කරුවකු ඔහු/ඇය පත්කරනු ලබන පාසලේ සේවය කරන බවටත්, කවර හෝ හේතුවක් නිසා එම පාසලෙන් පිටතට ස්ථාන මාරුවක් ඉල්ලුම් නොකරන බවටත් ගිවිසුමකට අත්සන් කළ යුතු වේ. එහෙත් සේවයේ අවශ්‍යතාවයන් මත හෝ පරිපාලනමය වූ හේතූන් මත ඔහු/ඇය වෙනත් දිස්ත්‍රික්කයකට/පාසලකට මාරු කර යැවීමේ බලය දෙපාර්තමේන්තුව සතුව පවතිනු ඇත.

3. **මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේය.**—(i) ඒකාබද්ධ වැටුප—වර්ෂයකට රු. 2,700—21 × 60—රු. 3,960 (රු. 2,880 ට හා රු. 3,360 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්).

(ii) කල්පිත වැටුප—වර්ෂයකට රු. 792—21 × 42—රු. 1,674 (රු. 918 ට හා රු. 1,254 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පහත සඳහන් කරුණු වලින් යුක්ත වන බවට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කර සිටිය යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් ද යුක්තව සිටින බව;

(ආ) 1973.11.20 දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ අවුරුදු 35 ට වැඩි හෝ නොවන බව;

(ඇ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය :—

(i) දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතයට සාමාර්ථය ඇතිව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය ලබා තිබීම. (යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතුය.)

හෝ

(ii) දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතයට සාමාර්ථය ඇතිව, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට වැඩි නොවන වාර ගණනකදී විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබීම. (යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.)

**සටහන.**—දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතයට සාමාර්ථය ඇතිව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රයේ හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය සාමාර්ථය ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට වැඩි නොවන වාර ගණනකදී හෝ සමත් වී ඇති විෂයයන්ගෙන් විෂයයන් හතරක් හෝ ඊට වැඩි ගණනකට සම්මාන ලබා ඇති අය පුරප්පාඩු පවත්නා පාසලකට ඉල්ලුම් කරනු ලබන අය අතර සිටිත් නම්, ඔවුන් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ. මෙම ප්‍රමුඛතාවය දක්වනු ලබන්නේ මෙම ඡේදයේ (ඈ) උප ඡේදයේ සටහනේ සඳහන් ප්‍රමුඛ පිලිවෙලට යටත්වය.

(ඈ) තමන් පදිංචිය දක්වා ඇති ගමේ/ආසන්න ගමේ ස්ථිර පදිංචිකරුවෙකු බව පහත සඳහන් කුමන හෝ එක් ලියවිල්ලක් මඟින් ඔප්පු කිරීමට අයදුම්කරු සමත් විය යුතුය :—

(i) ගමේ/ආසන්න ගමේ උපන් බව. (උප්පැන්න සහතිකය මඟින්);

(ii) ගමේ/ආසන්න ගමේ ලියාපදිංචි ඡන්ද දයකයකු බව (ඡන්දදයක ලේඛණයක සහතික කළ උධෘතයක් මඟින්);

(iii) අයදුම්කරුගේ දෙමාපියන් ස්ථිර පදිංචිකරුවන් වීමත් සමඟ පසු ගිය අවුරුදු තුන ඇතුලත ගමේ/ආසන්න ගමේ ස්ථිර පදිංචිකරුවෙකු බව (ගෘහ මූලික ලැයිස්තුව මඟින්);

(iv) ගමේ/ආසන්න ගමේ පිහිටි පාසලකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා./පෙ.) විභාගය හෝ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය සමත් වූ බව (අදල සහතිකයක් මඟින්).

**සටහන.**—පාසල්වල පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ දී ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ පහත සඳහන් අයුරිනි :—

(i) පාසල පිහිටි ගමේ ස්ථිර පදිංචිකරුවන්;

(ii) පාසල පිහිටි ගමට ආසන්න ගමේ පදිංචිකරුවන්;

(iii) පාසල පිහිටි ඡන්ද කොට්ඨාශයේ පදිංචිකරුවන්;

(iv) පාසල පිහිටි දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්;

තවද මෙහිදී ගැහැණු අයදුම්කරුවන්ට වැඩි ප්‍රමුඛත්වයක් ලැබේ.

(ඉ) අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඔවුන්ගේ ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය;

(ii) අධ්‍යාපන සහතික;

(iii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

**සටහන.**—ඉහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ඉල්ලුම් පත්‍ර සහ අනිකුත් අදළ ලියකියවිලි මෙම නිවේදනයේ 1 වැනි ඡේදයේ පරිදි එවිය යුතු අතර, අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවල කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් පොදු කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

8. තැපැලේ දී සිදුවිය හැකි කවර ප්‍රමාදයක් හෝ මග හැරවීම සඳහා සිය ඉල්ලුම්පත් කල් වේලා ඇතිව ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලෙස ඉල්ලුම්කරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රේමදස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

## දිස්ත්‍රික් සේවා ක්‍රමය සටතේ රජයේ දෙමළ මාධ්‍ය දුෂ්කර පාසැල්වල සහතික පත්‍ර නොලත් සිංහල උපගුරු තනතුරු

ඉල්ලුම් කරන දුෂ්කර පාසල :————.

1. මුලට පෙලපත් නාමය සහිත සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. (i) ස්ථිර ලිපිනය :————.
   (ii) ඡන්ද කොට්ඨාශය :————.
3. (i) ස්ථිර වශයෙන්ම පදිංචි ස්ථානය (ගම සඳහන් කරන්න) :————.
   (ගැසට් නිවේදනයේ 4 (ඇ) ඡෙදය අනුව)
   (ii) එය අයත් ඡන්ද කොට්ඨාශය :————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
5. ඉල්ලුම්කරු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වූ පාසල :————.
6. විවාහක ද අවිවාහක ද යන බව :————.
7. උපන් දිනය හා ස්ථානය :————.
8. 1973.11.20 දිනට වයස :————.
9. (i) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
   (ii) අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————.
10. ජාතිය :————.
11. ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන්ද යන බව :————.
12. සුදුසුකම් :—
   (1) ජ්‍යෝ.පා.ස./අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :

| | වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | ලබා ඇති සාමාර්ථය (අදල කොටුවේ '√' සළකුණ යොදන්න) | | | කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශිෂ්ඨ | සම්මාන | සාමාන්‍ය | |
| පළමු වර | | | 1. | | | | |
| | | | 2. | | | | |
| | | | 3. | | | | |
| | | | 4. | | | | |
| | | | 5. | | | | |
| | | | 6. | | | | |
| | | | 7. | | | | |
| | | | 8. | | | | |
| දෙවන වර | | | 1. | | | | |
| | | | 2. | | | | |
| | | | 3. | | | | |
| | | | 4. | | | | |
| | | | 5. | | | | |
| | | | 6. | | | | |
| | | | 7. | | | | |
| | | | 8. | | | | |

   (2) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

13. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඒ සම්බන්ධ විස්තර පහත සපයන්න :————.
   (1) දෙපාර්තමේන්තුවේ නම :————.
   (2) දරණ ලද තනතුර සහ එම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ද යන බව :————.
   (3) පත් වූ දිනය :————.
   (4) අස් වූ දිනය සහ අස්වීමට හේතු :————.
   (5) ගුරුවරයෙක් නම්, ලියාපදිංචි කිරීමේ අංකය සහ අන්තිමට සේවය කළ පාසල :————.
14. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පික විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය උඩ සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අත්හැර ගිය අයෙකු සේ සලකා නැති බවත්, මා පරම්පරාවෙන්/ලියාපදිංචි කිරීමෙන් ලාංකිකයෙකු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙලිවුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, පත්කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි.)

...............................................ගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය.

————,
දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා හෝ ඒ වෙනුවට
බලය ලත් නිලධාරියාගේ අත්සන.

තනතුර :————

දිනය :————.

ලිපිනය :————.

10–556—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : ඊඑම්/4/1/183 (III)

**1973 ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීම සඳහා වූ විවෘත තරඟ විභාගය**

1973 ඔක්තෝබර් 05 වැනි දින අංක 80 දරන ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයෙන් නියම කරන ලද, ශ්‍රී ලංකා විදේශ සේවයට ආධුනිකයන් බඳවා ගැනීම සඳහා වූ විභාගයේ දිනය මෙයින් සංශෝධනය කර සිටිනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවයට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා වූ විභාගය දැන් පවත්වනු ලබන්නේ 1973 නොවැම්බර් මස 17 සහ 18 වැනි දිනවලය.

වී. ටී. ජයසිංහ,
ලේකම්.

1973 ඔක්තෝබර් 10 වැනි දින,
කොළඹ 1,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

10–716—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ඇපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | 73.10.05 | සිකුරාද | ... | 73.09.25 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 73.10.12 | සිකුරාද | ... | 73.10.03 | බදාද | දවල් | 12.00 |
| | 73.10.19 | සිකුරාද | ... | 73.10.10 | බදාද | දවල් | 12.00 |
| | 73.10.26 | සිකුරාද | ... | 73.10.17 | බදාද | දවල් | 12.00 |
| නොවැම්බර් | 73.11.02 | සිකුරාද | ... | 73.10.24 | බදාද | දවල් | 12.00 |
| | 73.11.09 | සිකුරාද | ... | 73.10.31 | බදාද | දවල් | 12.00 |
| | 73.11.16 | සිකුරාද | ... | 73.11.07 | බදාද | දවල් | 12.00 |
| | 73.11.23 | සිකුරාද | ... | 73.11.14 | බදාද | දවල් | 12.00 |
| | 73.11.30 | සිකුරාද | ... | 73.11.21 | බදාද | දවල් | 12.00 |
| දෙසැම්බර් | 73.12.07 | සිකුරාද | ... | 73.11.28 | බදාද | දවල් | 12.00 |
| | 73.12.14 | සිකුරාද | ... | 73.12.05 | බදාද | දවල් | 12.00 |
| | 73.12.21 | සිකුරාද | ... | 73.12.12 | බදාද | දවල් | 12.00 |
| | 73.12.28 | සිකුරාද | ... | 73.12.19 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.